# එළවළු නිෂ්පාදනය හා අලෙවිය

මෙරට හැම පලාතකම සාමාන්‍යයෙන් එළවළු වගා කෙරෙනවා. එනමුත් ඇතැම් වර්ග වගා කිරීම නිශ්චිත පලාත්වලට සීමා වූ එකක්. වෙළඳ පොල උදෙසා එළවළු වගා කිරීම මෙලෙස සිදු වන්නේ ඒ ඒ පළාත්වල පවතින කෘෂි-කාලගුණික තත්වයන්ට ගැලපෙන පරිදියි.

මේ අනුව මෙරට එළවළු වගා කෙරෙන ප්‍රධාන ප්‍රදේශ තුනක් අපට හඳුනා ගත හැකි යි. ඒවා නම්:

අ. නුවරඑළිය, බණ්ඩාරවෙල ඇතුළත් උඩරට තෙත් කලාපය.


ආ. යාපනය අර්ධද්වීපය

ඇ. පහත රට තෙත් කලාපය හා වියළි කලාපය යනුවෙනි.

මෙරට වැවෙන එළවළු මෙසේ වර්ග කළ හැක.

1. කොළ එළවළු වර්ග
   කතුරු මුරුංගා, කන්කුන්, මුකුණුවැන්න, ගොටුකොළ, නිවිති, සාරන, කොහිල, ගෝවා, සලාද ගස්, ලීක්ස් හා මල් ගෝවා.

2. එළවළු පලතුරු.
   අ. බණ්ඩක්කා, වම්බොටු, තක්කාලි, හා මාළු මිරිස්.



නුවරඑළියේ ලීක්ස් වගාවක්

   ආ. වට්ටක්කා, අළුපුහුල්, කැකිරි, පිපිඤ්ඤා
   ඇ. පතෝල, කරවිල, වැටකොළු හා දියලබු.
   ඇ. මෑ හා බෝංචි
   ඉ. අළු කෙසෙල්

3. අල වර්ග
   අ. කැරට්, බීට්, රාබු, නෝකෝල්.
   ආ. පිෂ්ඨ එළවළු වර්ග වන අර්තාපල්, බතල, රාජ අල, මයියොක්කා.

ශ්‍රී ලංකාවේ වගා කෙරෙන එළවළු සම්ප්‍රදායිකව

අ. උඩරට හෝ විදේශීය එළවළු වර්ග. උදා: ගෙඩි ගෝවා, කැරට්, ලීක්ස්, මල්ගෝවා, හා

ආ. පහතරට හෝ දේශීය එළවළු වර්ග. උදා: බණ්ඩක්කා, මෑ කරල්, කරවිල, වට්ටක්කා යනාදිය යනුවෙන් හඳුන් වනවා.

රටේ පළාත් බොහොමයක ම විශේෂයෙන් වියලි කලාපයේ පෙබරවාරි -මාර්තු මාසවල වැඩි වශයෙන් එළවළු නිෂ්පාදනය කෙරෙන අතර, අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල උඩරට හා මැදරට එළවළු වැඩි වශයෙන් නිෂ්පාදනය කෙරේ.

උඩරට එළවළු වගා වල ව්‍යාප්තිය බැලූ විට එය වැඩි වශයෙන් කෙරෙන්නේ බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල යි. එළවළු ගොවිපලක සාමාන්‍ය ප්‍රමාණය බදුල්ල අක්කර 1/4 සිට 10 දක්වා ද, නුවරඑළියෙහි අක්කර 1/8 සිට 3 දක්වා ද වෙනස් වේ. තවද, මේ දිස්ත්‍රික්ක දෙක ගෝවා, කැරට් සහ ලීක්ස් යන උඩරට එළවළු නිෂ්පාදනය අතින් ප්‍රමුඛ ස්ථානය ගනී. 1975/76 මහ සහ 1976 යල කන්න වල දී මෙරට ගෝවා අක්කර 3,000 ක් ද, කැරට් අක්කර 932 ක් ද, ලීක්ස් අක්කර 797 ක් ද, වගා කෙරුණු අතර, ලබා ගත් මුළු නිෂ්පාදනය ගෝවා රාත්තල් 1,58,01,643 ක් ද, කැරට් රාත්තල්

57,87,835 ක් ද, ලීක්ස් රාත්තල් 13,78,433 ක් ද විය.

පහතරට එළවළු අතරින් වෙළඳ පොළ සම්බන්ධව විශේෂයෙන් වැදගත් වන්නේ වියළි කලාපයේ නිෂ්පාදනය කෙරෙන එළ වළු වර්ග යි. අළු කෙසෙල් ,වම්බටු, වට්ටක්කා, වැඩිම ඉඩම් ප්‍රමාණයක වගාකෙරේ. වියළිකලාපයේ වගා කෙරෙන එළවළු වර්ග නිෂ්පාදනය අතින් ප්‍රමුඛ ස්ථානය ගන්නේ මොණරාගල, අනුරාධපුරය, කුරුණෑගල, මාතලේ හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයි. මෙම එළවළු වර්ග ප්‍රධාන වශයෙන් වගා කෙරෙන්නේ හේන්වලයි. හේනක ඉඩම සැකසීම, බෝග රැකබලා ගැනීම හා වල් පැලෑටි මර්ධනය සඳහා වියදම් උඩරට එළ වළු ගොවිතැන හා සසඳන විට අවම මට්ට මක පවතින බව කිව හැකි යි. හේන් ගොවිතැනේ වගා සැලැස්මක් හෝ වෙළඳ පොළ ඉල්ලුමක් බලා වගා කිරීමක් නො වන නිසා වගා කන්න තුළ එම එළවළු නිෂ්පාදනයේ විශාල අතිරික්තයක් ඇතිවනු දක්නට ලැබෙනවා. 1975/76 මහ සහ 1976 යල කන්නයේ මෙරට අළු කෙසෙල් අක්කර 27,719 ක් ද, වම්බටු අක්කර 24,663 ක් ද, වට්ටක්කා අක්කර 13,737 ක් ද, වගා කර තිබුණ අතර, නිෂ්පාදනය අළු කෙසෙල් රාත්තල් 4,81,25,313 ක් ද, වම්බටු රාත්තල් 4,73,53,742 ක් ද, වට්ටක්කා රාත්තල් 5,51,85,328 ක් ද විය.

යාපනය අර්ධද්වීපයේ ගොවීන් උඩරට මෙන් ම පහත රට එළවළු බෝග වර්ග කිහිපයක් ම එහි අර්ධ ශුෂ්ක භූමියේ වගා කරති. එහි පවතින කාල ගුණික තත්ත්වයන් හා පසෙහි ස්වාභාවය ද, මෙලෙස වගා කටයුතු කිරීමට අවකාශ ඇති කෙරෙන අතර, මෙහි දී විශේෂ ලක්ෂණයක් වන්නේ වෙළඳ පොල තත්වයන්ට ගැලපෙන පරිදි ගොවිපල නිෂ්පාදනයන් සැලසුම් කර තිබීමයි.

**එළවළු පිළිබඳ පර්යේෂණ.**

උඩරට කලාපය සම්බන්ධයෙන් සීතාඑළිය ගොවිපලෙහි ද, වියළි කලාපය සම්බන්ධ යෙන් මහඉලුප්පල්ලම ද, මැදරට තෙත් කලාපය සම්බන්ධයෙන් පේරාදෙණිය හා කටුගස්තොට ද, පහතරට තෙත් කලාපය සම්බන්ධයෙන් වල්පිට ද, තිබෙන එළවළු පර්යේෂණ මධ්‍යස්ථාන ඒ ඒ කලාපයට ඔබින එළවළු සම්බන්ධයෙන් පර්යේෂණ කරයි. මේ ස්ථානවලට අයත් කාර්ය භාරය අකර ඒ ඒ කලාපයට උචිත නව එලවළු වර්ග ගැන පර්යේෂණ පැවැත්වීම, නව රෝපන ක්‍රම, කෘමි වසංගත, රෝග මර්ධනය, වල් පැලෑටි මර්ධනය, පෝර යෙදීම සහ වඩා හොඳ ශිල්පීය ක්‍රම වගාවට උපයෝගී කර ගැනීම ආදිය වේ.

**එළවළු බීජ සැපයීම.**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අත්හද බැලීම් අනුව කැරට්, බීට්, ගෝවා, ලීක්ස්, නෝකෝල්, මල් ගෝවා සහ බෝංචි ආදියෙහි බීජ මෙරට නිෂ්පාදන ආර්ථික වශයෙන් වාසිදයක නොවන බව පෙනී ගොස් තිබේ. ඒ නිසා සුදුසු වර්ග පිටරටින් තවදුරටත් ආනයනය කෙරේ. රටේ ජනප්‍රිය එළවළු වර්ග කිහිපයක බීජ අවශ්‍යතාවය මෙසේ ය.

| | රාත්තල්. |
|---|---|
| බෝංචි ඇට | 2,76,770 |
| ගෝවා | 3,603 |
| කැරට් | 15,667 |
| බීට්රූට් | 22,443 |
| ලීක්ස් | 1,512 |

**ව්‍යාප්ති කටයුතු.**

එළවළුවගා කටයුතු දියුණු කිරීම සම බන්ධව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති සමහරක් පියවරවල් මෙසේ ය.

අ. එක් එක් දිස්ත්‍රික්කවල එලවළු වගා වගා කරන්නන් පිළිබඳව ව්‍යාප්ති වැඩ සටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ගොවීන්ට අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය ලබා ගැනීමට සහාය දීම සහ ඔවුන් ගේ වැඩ සට හන් ප්‍රාදේශීය ආයතන, නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳව වෙනත් රජයේ දෙපාර්තමේන්තු සමඟ ඒකාබද්ධව

ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ට සහායවීම සඳහා විශේෂ කෘෂි කාර්මික උපදේශකවරුන් පත් කිරීම.

ආ. පුද්ගලිකව හමු වීමෙන් හා සමූපකාර සමිති මගින් කෙරෙන ක්‍රමවත් ව්‍යාප්ති කටයුතු හැර එලවළු වවන්නන් පුහුණු කිරීමේ පන්ති හා ඔවුන් ගේ වතුවල ආදර්ශ බිම් කොටස් ඇති කිරීමෙන් බීජ ප්‍රතිකාර ක්‍රම, තවාන් පාලනය, රසායනික පොර භාවිතය, පලිබෝධක හා රෝග මර්ධනය, අස්වැන්න කපා ගැනීම හා වර්ග කිරීමේ ශිල්ප ක්‍රම ආදිය පිළිබඳව දියුණු තත්වයක් ඇති කිරීම සඳහා එළවළු වගා කරන දිස්ත්‍රික්කවල පුහුණු පන්ති පැවැත්වීමද වේ.

**පාරිභෝගික අවශ්‍යතා.**

එළවළුවල සාමාන්‍ය වාර්ෂික පරිභෝජනය එක් අයෙකුට වසරකට රාත්තල් 74.74 ක් ක් හෝ දිනකට අවුන්ස 3 1/2 පමණ බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කරන ලද සමීක්ෂණයකින් හෙලි වී තිබේ. කෙසේ වුව ද, එක් එක් පවුලක එලවළු පරිභෝජනය තීරණය වනුයේ එක් අතකින් එළවළු සුලබ වීම හා මිළ ගණන් අනුව ද හා අනික් අතින් ආදායම් හා ජීවන තත්වය අනුව ද වේ.

දිවයිනේ දෛනික එළවළු අවශ්‍යතාවය ටොන් 1,800 ක් පමණ වේ යැයි දළ වශයෙන් ඇස්තමේන්තුකර තිබේ. කොළඹට පමණක් ටොන් 80–100 දක්වා වූ ප්‍රමාණයක් දිනපතා අවශ්‍ය වන්නේය.

එළවළු සැපයීමේ එක් ප්‍රධාන ගැටළුවක් වන්නේ එකිනෙකට වෙනස් ප්‍රධාන වර්ග 50 කට පමණ අයත් මෙම එළවළු නිෂ්පාදනය විවිධ ප්‍රදේශයන්හි එකිනෙකට වෙනස් කාලයන්හි නිපදවීම යි.

දැනට සියළු ම එළවළු වර්ග වගා වී ඇති මුළු බිම් ප්‍රමාණය පවත්නා ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් පමණ වේ. වගා කෙරෙන බිම් ප්‍රමාණය, විවිධ වර්ග හා විවිධ ප්‍රදේශ අතර පැතිර ඇති විෂම පිළිවෙළ හේතු කොට ගෙන එක් එක් එළවළු වර්ග වල බහුලත්වය හා හිඟය එක් එක් කාලවලට උද්ගත වේ.



වියළි කලාපයේ හේනක ජීවිතය

**ගොවීන් ගේ ප්‍රශ්න.**

අලෙවි කරණයේ දී ගොවීනට මුහුණ පෑමට සිදුව ඇති ප්‍රධාන ප්‍රශ්න නම්:

එළවළු වල ඇති ඉක්මන නරක් වන ස්වභාවයක් ප්‍රමාණවත් ගබඩා, පහසුකම් නොතිබීමත් නිසා මිලෙහි ඇති වන උච්චාවචනයන් ගෙන් උපරිම ප්‍රයෝජන සඳහා යොදා ගැනීමට ගොවීනට ඉඩ නොලැබීම.

පෞද්ගලික අලෙවි සංවිධානවලට ගොවීන් අධික ලෙස ගැතිව සිටීමේ ප්‍රතිපලයක් වශයෙන් ඉහළ මිල ගණන් වලින් ඔහුට වාසියක් නොලැබීම.

ගොවීන්ගේ තරඟකාරී අලෙවි සංවිධානයන් නොමැති බැවින් පුද්ගලික අලෙවි සංවිධාන වලට ප්‍රධාන තැනක් හිමි වී තිබීමක් වේ.


## මිලකරණය.

මෙහි දී තෝරා ගත් එළවළු වර්ගයක අලෙවි කරන ක්‍රියාවලින්යේ විවිධ අවස්ථා වන්හි මිල විස්තාරණය දැක්විය හැකිය. ගෝවා රාත්තල් 100 ක මිල එළවළු නිෂ්පාදනය කරන ගොවියා ගේ සිට අවසානයේ දී පාරිභෝගිකයා දක්වා සිදු වන අලෙවි කරන ක්‍රියාවලියෙහි එහි මිල වැඩි වන හැටි, මෙම ආයතනය පල කල 'එළවළු නිෂ්පාදනය හා අලෙවිය' නමැති ප්‍රකාශනයෙන් උපුටා මෙහි දක්වා ලමු. කෙසේ වුව ද, මෙහි සඳහන් මිල ගණන් 1974 මුල් භාගයේ ඒවා ය.

ගොවා රාත්: 100 ක

| | වියදම රු. | මිල රු. |
|---|---|---|
| 1. නිෂ්පාදන මට්ටම | | |
| ගොවීන් ලැබූ ශුද්ධ මිල | | 7.05 |
| ප්‍රවාහනය | 3.50 | |
| ලොරි වලින් බෑම | .25 | |
| විකුණුම් කොමිස් (10%) | 1.20 | |
| 2. කොමිස් නියෝජිත තොග වෙළඳ මට්ටම | | 12.00 |
| 3. සුළු – තොග වෙළඳ මට්ටම | 12.00 | |
| සුළු–තොග වෙළඳුන් ගේ ලාභ ආන්තිකය හා මෙහෙයුම් වියදම් | 6.00 | 18.00 |
| 4. සිල්ලර වෙළඳ මට්ටම | 18.00 | |
| පැටවීම හා පරිවහරණය | .50 | |
| ප්‍රවාහනය | 1.00 | |
| පිරිසිදු කිරීම, නරක් වීම, අලෙවිය සඳහා සකස් කිරීම ආදිය නිසා වන පාඩුව | 6.00 | |
| සිල්ලර වෙළඳාමෙන් ලාභ ආන්තිකය හා මෙහෙයම් වියදම් | 12.50 | |
| 5. පාරිභෝගිකයා ගෙවූ මිල | | 38.00 |
| 6. දළ අලෙවි ආන්තිකය | 30.95 | |

එනමුත් එළවළු නිපදවන්නාට නිෂ්පාදන ද්‍රව්‍යයන් සාධාරන මිලකට අලෙවි කර ගැනීමට හා පාරිභෝගිකයාට සාධාරන මිල කට ඔහු ගේ අවශ්‍යතාවයන් ලබා ගැනීම වත් ඉඩ සැලසීමට නම් !



හේන්වල වට්ටක්කා වෙළඳපොලට යවන්නට පෙර

1. වවන්නන් ගේ ද්‍රව්‍ය එකතු කිරීම.

2. ද්‍රව්‍ය වර්ග කිරීම, ඇසිරීම හා ප්‍රවාහරණය

3. බෙදා හැරීමේ තොග හා සිල්ලර වෙළඳ නිෂ්පාදනයන්හි වාරික අඩු වැඩිවීම වළක්වා ගැනීම උදෙසා.

   අ. සකස් කිරීමෙන් හෝ සුරක්ෂිත කිරීමෙන්.

   ආ. ක්‍රමවත් නිෂ්පාදනය වාරික අඩුවැඩි වීම් වලක්වා ගැනීම නිසි පරිදි කළ යුතු බව දක්වා ඇත.

**ගොවි නිෂ්පාදිත රැස් කිරීම.**

1. එළවළු වගාව ස්ථිර රැකියාවක් වූ ප්‍රදේශ වන නුවරඑළිය වැනි ස්ථානයන්හි නියෝජිතවරු පූර්ණ කාලීනව එම කට යුතුවල නිරත වේ.

2. බෙලිඅත්ත, හක්මන බඳු පහත රට ප්‍රදේශවල එකතු කරන්නන් මේ ගනයට ම අයත් වේ. යාපනයේ කොමිස් නියෝජිතයන් ඔවුන්ට අනුරාධපුරයෙන් ලැබෙන එළවළු එකතු කරන අතර, යාපනයේ ගොවීන් ගේ එළවළු නිෂ්පාදන කොළඹට එවනු ලැබේ.

3. නොච්චියාගම, නෑගම, තලාව, තිස්ස මහාරාමය වැනි නගර වල ස්ථිර කඩ සාප්පුකරුවන් සහ ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් වෙළඳ සම්බන්ධතා පවත්වන එළවළු නිෂ්පාදකයින්ගෙන් ලබා ගන්නා එළවළු එකතුකර කොළඹ, නුවර හෝ යාපනය කොමිස් වෙළඳ පොළට යවයි. ඒවාගේම වගා කන්න අනුව වෙරළ බඩ ප්‍රදේශ වලින් මේ පළාත්වලට එන එළවළු එකතු කරන වෙළඳුන් තාවකාලික මධ්‍යස්ථාන පිහිටුවා කටයුතු කරන අතර, සමහරක් කෙලින් ම ජන පදවලට හේන් වලට ගොස් එළවළු නිෂ්පාදන මිළ දී ගනී.

4. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්.

**තොග වෙළඳ පොළ.**

**දිවයිනේ ප්‍රධාන තොග වෙළඳ මධ්‍යස්ථානය කොළඹ පිටකොටුවේ කච්චේරිය පාරේ පිහිටුවා තිබේ. මෙහි තොග වෙළඳුන් 300 කට අධික ප්‍රමාණයක් සිටී. හැමදම උදේට ලංකාවේ විවිධ පළාත්වල එළවළු එකතු කරන නියෝජිතයන් එවන එළවළු රැගත් ලොරි මෙහි ළඟාවේ. මේ අවස්ථාවේ හංවැල්ල, අම්බලන්ගොඩ, ගාල්ල, මීගමුව වැනි පළාත්වලින් සිල්ලර වෙළඳුන් එළවළු මිළදී ගැනීමට මෙහි පැමිණ සිටී.**

කොළඹ තොග වෙළඳ පොලේ වෙළඳුන් සාමාන්‍යයෙන් හඳුන් වන්නේ කොමිස් නියෝජිතයන් හැටියට ය. ඔවුන් ගේ ගාස්තුව හැටියට කරන්නේ අලෙවි කරන මිලෙන් පරිවහනයට, අපතේ ගිය දෑට, යනාදී වියදම් හැර 10% ක ප්‍රමාණයකි. සමහරක් කොමිස් නියෝජිතවරු එක් එක් එළවළු වර්ගයක් සම්බන්ධයෙන් පමණක් කටයුතු කරන අය වේ. කොළඹ වෙළඳ පොලේ මෑතක වන තුරු වට්ටක්කා සම්බන්ධව ප්‍රධාන වශයෙන් කටයුතු කලේ එක් වෙළෙන්දෙක් පමණි. අමු මිරිස් වෙළඳම තොග වෙළඳුන් හය දෙනෙක් කළ ව්‍යාපාරයකි. මහනුවර පන්සල වෙළඳාම මුළුමනින් ම වාගේ පැවතියේ නව මධ්‍යම වෙළඳ පොලේ එක් වෙළෙන්දෙක් ගේ අතේ ය.

ඒවාගේ ම කොමිස් නියෝජිතයෝ මහ නුවර, යාපනය සහ එරාවූර් ප්‍රදේශවල සිටී. මහනුවරට ප්‍රධාන වශයෙන් එළවළු ලැබෙන ප්‍රදේශය නම් හේවාහැට ප්‍රදේශය යි. මහනුවරට එකතු වන එළවළුවලින් 25% ක් ම එම ප්‍රදේශයේ ම ප්‍රයෝජනයට ගන්නා අතර, ඉතිරිය ලංකාව පුරාම බෙදා හරිනු ලැබේ.

**සිල්ලර වෙළඳාම.**

1. විවිධ නගර සභාවන්වල වෙළඳපලවල ස්ථිර කඩකරුවක්. උදා: තිඹිරිගස්යාය, කොල්ලුපිටිය, වැල්ලවත්ත, කෑගල්ල, මහනුවර.

2. අලෙවි සංවර්ධණ දෙපාර්තමේන්තුවේ වෙළඳ මධ්‍යස්ථාන.
3. කොළඹ සහ අනෙකුත් නගරවල මංසන්ධි වල සිටින එළවළු කඩකරුවන්.
4. සති පතා පැවැත් වෙන පොලවල්.
5. තැනින් තැන ගෙන ගොස් එළවළු විකුණන වෙළඳුන්; උදා: වට්ටි අම්මලා.

මේ වෙළඳුන් ඒ ඒ පළාත් බදව ජීවත් වය අය ගේ රුචි අරුචිකම් අනුව තම තමන් විකුණන එළවළු වර්ග නිශ්චත කරයි. කොල්ලුපිටිය වෙළඳ පොලෙහි වැඩි වශයෙන් තානාපති කාර්යාලවල සේවය කරන විදේශිකයන්ට අවශ්‍ය වන එළවළු වර්ග තබා තිබේ. වැල්ලවත්ත ප්‍රසිද්ධ වෙළඳ පොලේ එම ප්‍රදේශයේ වැඩි වශයෙන් ජීවත් වන දෙමළ ජනතාව අතර ජනප්‍රිය එළවළු වර්ග විකිණීමට තැබීමට වැඩි උනන්දුවක් ගනී.

එළවළුවල සිල්ලර වෙළඳාමෙන් 75% ක් පමණ පුද්ගලික වෙළඳුන් අතේ පවතී. ඉතිරිය තවත් ආයතන දෙකක් නම්, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව, සහ සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවිසංගමය සතුය. මේ තත්වය අනුව පෙනී ගියා එළවළු වෙළඳ පොලේ මිල පිහිටීමට මධ්‍යස්ථාන තුනක් වැදගත් වන බව. ඒවා නම් කොළඹ, මහ නුවර, යාපනයයි. වඩාත්ම වැදගත් වන්නේ කොළඹ මධ්‍යස්ථානයයි. එහි වන මිළ තීරණය අනෙකුත් මධ්‍යස්ථාන දෙකට බලපායි. දිස්ත්‍රික්කයෙන් පිටත ද සිල්ලර වෙළඳුන් කොළඹට පැමිණ එළවළු මි ළ දී ගන්නා හෙයින් කොළඹ වෙළඳපොලේ දශ ලක්ෂ යක ජනගහනයට එළවළු සැපයීමට සිදු කෙරෙනවා. කෙසේ වෙතත් එළවළු වෙළඳ පොළ ඉතාම ඉඩකඩ ඇහිරුණ මධ්‍යස්ථාන යක්. එහි ප්‍රමාණය අක්කර 3/4 ක් පමණ වේ. ඇත්තවශයෙන් ම මෙබඳු ජනගහණ යකට එළවළු සැපයිය යුතු ස්ථානයක් පිහිටුවීමේදී ආහාර හා කෘෂිකර්ම සංවිධානය තීරණය කර තිබෙන තත්වයන්ට අනුකූලව නම් අඩුම වශයෙන් අක්කර 30ක භූමි ප්‍රමාණයක් වත් වෙළඳ පොලක් මේ සඳහා උවමනා වෙනවා.

(ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරි යංක් දයානන්ද විසිනි)